## ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය- 2013

ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1988 අංක 77 දරන ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ 7(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3. විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1. තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02</u>**

සමාලෝචිත වර්ෂය තුළ මුදල් ගලායාම් සහ ගලාඒම් පිළිබිඹු වන පරිදි ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබූ අතර ඒ සම්බන්ධ පහත දුර්වලතා නිරීක්ෂණය විය.

i. වර්ෂය තුළ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ සත්‍ය මුදල් ප්‍රවාහය රු. 17,827,061 ක් වුවද එය රු. 81,976,570 ක් ලෙස දක්වා තිබුණි.

ii. මණ්ඩලය විසින් 1997 වර්ෂයේදී කරන ලද රු.4,300,000 ක ආයෝජනය සමාලෝචිත වර්ෂයේ මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි.

iii. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව වර්ෂය අවසානයට මුදල් සහ ආසන්න මුදල් වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

**(ආ) <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7</u>**

වත්කමක් භාවිතය සඳහා සුදුසු තත්ත්වයට පත්කල අවස්ථාවේ සිට වත්කමක ක්ෂය කිරීම ආරම්භ කල යුතු වුවත් එයට පටහැනිව වත්කම් මිලදීගත් වර්ෂයේ ක්ෂයවීම් නොසලකා හැර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානය විසින් පෞද්ගලික සමාගමක කර තිබූ ආයෝජනයේ අගය සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 4.3 ක් වූ අතර එම සමාගම ඈවර කර රු.61,500 ක් වටිනා වත්කම් මධ්‍යස්ථානය අත්පත් කරගෙන තිබුණු නමුත් මෙම සමස්ථ ගණුදෙනුව ගිණුම්ගතකර නොතිබුණු අතර ඒ හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු. 4,238,500 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් ලබාගත් ණය මුදල සඳහා ගෙවිය යුතු ණය පොලිය රු.425,677 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර ණය මුදලේ අගයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ආපසු ගෙවිය යුතු රු.351,000 ක කුලී තැන්පතු, වගකීමක් ලෙස දක්වනවා වෙනුවට ආපසු අයකර ගත හැකි තැන්පතුවලින් අඩුකර දක්වා තිබුණි.

(ඇ) කුලී ගිවිසුම අවසානයේදී ආපසු ගෙවන ලද රු.314,820 ක කුලී තැන්පතු මුදල අදාල වගකීම් ගිණුම හර කරනවා වෙනුවට ආපසු අයකර ගත හැකි තැන්පතු ගිණුමට හරකර තිබුණි.

**2.3. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 අංක 77 දරන ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ 1 වන වගන්තිය | ආයතනයේ නාමය "ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය" වුවද, අවසන් මූල්‍ය ප්‍රකාශනයන්හි හා ලිපි ශීර්ෂයන්හි " ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය" ලෙස භාවිතා කර තිබුණි. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 චක්‍රලේඛයේ 9.3.1 ඡේදය | සේවකයින් බඳවා ගැනීමේ පටිපාටියක් ආයතනය විසින් අනුමත කරවාගෙන නොතිබුණි. |
| (ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | ආයතනය සතු ස්ථාවර වත්කම් වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක යන්ත්‍ර සඳහා වෙනම ලේඛණයක් චක්‍රලේඛය ප්‍රකාරව නඩත්තු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 7,523,410 ක අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපීව රු. 573,779 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,949,631 ක වැඩි වීමක් නිරීක්ෂණය විය. 2013 වර්ෂයේ දී ගොඩනැගිලි කුලී ආදායම රු. 6,714,447 කින් ද ස්ථාවර තැන්පතු සඳහා පොලී රු.5,530,653 කින් වැඩිවීම සහ පන්ති කාමර කුලී ලෙස රු. 1,894,365 ක නව ආදායමක් තිබීම ද මෝටර් රථ විකුණුම් ලාභය වූ රු.3,239,115 ද මේ සඳහා විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 ආර්ථික නොවූ ගණුදෙනු

එකතු කළ අගය මත බදු යෙදවුම් හා නිමවුම් වෙනම පාලන ගිණුමක ඇතුළත් කිරීම වෙනුවට පිළිවෙලින් ආදායම් සහ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයේදී තවදුරටත් ගෙවිය යුතු හා හිලව් කරගත යුතු ශේෂයන් ගිණුම් මඟින් අනාවරණය නොවීය. බදු උපලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී තවදුරටත් අයකර ගතයුතු ශේෂය රු.11,964 ක් ලෙස පෙන්නුම් කර තිබුණත් එය ගිණුම් මඟින් අනාවරණය නොවීය.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාර ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය ඇතුළත් වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 5.3 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛය ප්‍රකාරව විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා රු. 17,827,061 ක ජංගම නොවන වත්කම් මිලදී ගෙන තිබුණ ද ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.5 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 5.2.1 ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණු අතර අයවැය ගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 32 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

### 5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2009 වර්ෂයෙන් පසුව මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.7 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

2012 සැප්තැම්බර් 19 දින පවත්වන ලද පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ දී ලබා දී ඇති නියෝගය අනුව පාලිත සමාගමක රු. මිලියන 5ක් ආයෝජනය කිරීම සම්බන්ධව වාර්තාවක් විගණනය වෙත මාසයක් ඇතුලත ලබාදිය යුතු බව නියෝග කර ඇතත් ඒ සම්බන්ධ වාර්තාවක් විගණනයට ලබාදී නොතිබුණි.

**6 පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ලේකම් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ආයෝජන
(ආ) වියදම් පාලනය
(ඇ) වත්කම් කලමනාකරණය